# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/47 - 2017 දෙසැම්බර් මස 09 වැනි සෙනසුරාදා - 2017.12.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ආඥාව

1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, මෛත්‍රීපාල සිරිසේන වන මම, 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 02 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නිවේදනය මගින් පහත උපලේඛනයෙහි සඳහන් වන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජනජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන බව සැළකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවන් ඇතිවීමට හැකියාවක් පැවතීම හේතුවෙන් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන පහත උපලේඛනයේ සඳහන් සේවාවන් පූර්වෝක්ත වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යාවශ්‍ය සේවාවන් බවට මෙම ආඥාවෙන් ප්‍රකාශයට පත් කරමි.

වර්ෂ දෙදහස් දහහතක් වූ දෙසැම්බර් මස 08 වැනි දින කොළඹ දී අත්සන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඔස්ටින් ප්‍රනාන්දු,
ජනාධිපති ලේකම්.

1A - PG 3809 — 450 (2017/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

1. මගීන් හෝ භාණ්ඩ සඳහා වන සියලුම පොදු ප්‍රවාහන සේවාවන්.

2. ඉහත සේවාවන් කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වාගෙන යාමට අත්‍යාවශ්‍ය වන්නා වූ දුම්රිය ධාවනය, දුම්රිය හා දුම්රිය මාර්ග නඩත්තුව හා නිසි ආරක්ෂාව සැපයීමට අදළ සංඥා පද්ධති හා මෙහෙයුම්, ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම ඇතුළු දුම්රිය දෙපාර්තමේන්තුවෙන් කළ යුතු කවරාකාරයෙන් වූ සේවාවන්.

3. ඉහත සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සියලු වැඩ හා ඕනෑම ආකාරයක ශ්‍රමය සැපයීම.

12 - 813

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.